**ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ (ජීඑෆ්ඒටීඑම්) සංරචකය - 2014**

-----------------------------------------------------------------------------------------------------

ඒඩ්ස් ක්ෂය රෝගය හා මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ සංරචකයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර.) සහ ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2011 නොවැම්බර් 22 දින එළඹි අංක එස්ආර්එල්-911-ජී15-එස් දරන ප්‍රදාන ගිවිසුමේ සී (8) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් මූල්‍යයනය හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුමට අනුව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකියනු ලබයි. යුද්ධයෙන් පසු ප්‍රදේශ වල සෞඛ්‍ය ආරක්ෂිත සේවා කලින් ප්‍රතිශ්ඨාපනය කිරීම මගින් එච්අයිවී/ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා හි වත්මන් අඩු ව්‍යාප්ති තත්වය පවත්වාගෙන යාම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය එ.ජ.ඩො. 15,513,020 ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූලි 15 දින ආරම්භ කළ අතර 2016 ජූනි 30 දින වන විට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තා වල ඇතුළත් කරන ලද තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු එකඟ වන බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------

සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද වටිනාකම රු. 15,865,967 ක කළමනාකරණ ගාස්තු, තාක්ෂණ සහයක වියදම් යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට යටිතල පහසුකම් සහ අනෙකුත් උපකරණ යටතේ ගිණුම් ගත කර තිබුණි.

**2.2.2 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

---------------------------------------------

පහත සඳහන් නීති රීතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 756 හී අවශ්‍යතාවයන්ට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අගය රු. 4,471,730 ක් වූ ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 33 හි 2.1.2 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | 2014 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | | 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| (ජීඑෆ්ඒටීඑම්) | 15.51 | 1,766.58 | 2.25 | 293.34 | 5.87 | 759.86 |
| එකතුව | 15.51 | 1,766.58 | 2.25 | 293.34 | 5.87 | 759.86 |

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ මහ භාණ්ඩාගාරය රු.මිලියන 317 ක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘතිය විසින් ඉන් රු. මිලියන 293 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද ලබා දීමට එකග වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 15.51 ක මුළු ප්‍රතිපාදනයෙන් 2014 දෙසැම්බර් 31 දක්වා එක්සත් ජනපද ඩොලර් මිලියන 6.0 ක් ගෝලීය අරමුදල විසින් නිකුත් කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලයෙන් සියයට 62 ක් අවසන් වන විටත් මුළු ප්‍රතිපාදනයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 5.87 ක් එනම් සියයට 37.85 ක් පමණක් භාවිතා කර තිබුණි. ඒ අනුව එක්සත් ජනපද ඩොලර් මිලියන 9.64 ක ප්‍රදාන ශේෂය ඉතිරි මාස 18 ක ව්‍යාපෘති කාලයේදී භාවිතා කළ හැකි ද යන්න සැක සහිතය.

(ආ) ප්‍රදාන ලැබීම් වල මුළු ප්‍රමාණයෙන් රු. 21,756,558 කට සමාන එක්සත් ජනපද ඩොලර් 166,017 ක් අදාල කාර්යයන් සඳහා භාවිතා නොකර සමාලෝචිත වර්ෂය අවසානයේ දී මහ භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවා තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ අදියර I යටතේ රු.18,517,810 ක වටිනාකමින් යුත් සුළු පරිමාණ රසායනාගාර 42 ක් ඉදිකර අදාල පලාත් අධිකාරීන් වෙත බාර දී තිබුණි. කෙසේ වෙතත් එම රසායනාගාර සඳහා රසායනාගාර උපකරණ 2015 මාර්තු 29 දින වන විටත් මිලදී ගෙන නොතිබීමේ හේතුවෙන් ඒවා භාවිතා කළ නොහැකිව පැවතුනි.

**3.3 මූල්‍ය පාලනය**

(අ) විගණනය සිදු කළ සමාලෝචනයේ දී ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස ව්‍යාපෘතියේ අයවැය ඇස්තමේන්තු භාවිතා කර නොතිබු බවට හඳුනාගත් නිරීක්ෂණ පහත දක්වා ඇත.

(i) ක්‍රියාකාරකම් 18 ක් සඳහා සිදු කළ එකතුව රු. 106,188,170 ක්වූ මුළු ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය තුළදී අදාල කාර්යයන් වෙනුවෙන් භාවිතා කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වල ඇතුළත් කළ ක්‍රියාකාරකම් 03 ක් යටතේ රු. 5,314,732 ක් වියදම් කර තිබුණි. තවද එම වියදම් පසුව විධිමත් කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘති මූල්‍ය පාලනයන් ශක්තිමත් කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල සිදුකරන ගනුදෙනු අභ්‍යන්තර විගණනයට යටත්කර නොතිබුණි.